# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2140/58 - 2019 සැප්තැම්බර් මස 14 වැනි සෙනසුරාදා - 2019.09.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත**

64 (5) වන වගන්තිය යටතේ පුරප්පාඩුවක් පිරවීම

පිළිගත් දේශපාලන පක්ෂයක් වන එක්සත් ජනතා නිදහස් සන්ධාන පක්ෂය විසින් නාමයෝජනා කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කරන ලද කුඩා විදනලාගේ ශාන්ත බණ්ඩාර මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන අටවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස එකී දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එම පුරප්පාඩුව පුරවනු පිණිස කුඩා විදනලාගේ ශාන්ත බණ්ඩාර මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වැනි සංශෝධනයේ විධිවිධාන සමග කියවිය යුතු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඉහත කී කුඩා විදනලාගේ ශාන්ත බණ්ඩාර මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා කුඩා විදනලාගේ ශාන්ත බණ්ඩාර මහතා අටවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස තෝරාපත් කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| **මහින්ද දේශප්‍රිය,** | **එන්. ජේ. අබේසේකර,** | **එස්. රත්නජීවන් එච්. හූල්,** |
| සභාපති, | සාමාජික, | සාමාජික, |
| මැතිවරණ කොමිෂන් සභාව. | මැතිවරණ කොමිෂන් සභාව. | මැතිවරණ කොමිෂන් සභාව. |

2019 සැප්තැම්බර් මස 14 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

09 - 982


1A - G 30983 — 387 (2019/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*